**<u>මදුරාවල ප්‍රාදේශීය සභාව</u>**

**<u>කළුතර දිස්ත්‍රික්කය</u>**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බස්නාහිර පළාත් සභාව විසින් 2013 වර්ෂයේදී ලබා දී තිබූ කැබ් රථයට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වියදම් යටතේ දරා ඇති වියදම ආදායමින් දායකවීමක් ලෙස සළකා ප්‍රාග්ධනිත කිරීම සටහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,059,409 කින් මෝටර් රථ ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වාර්තාවේ 2:2:1 (ඇ) ඡේදයේ කරුණු නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල් ගිණුමට රු.389,863 ක් හර කළ යුතු වුවත් ජර්නල් සටහන් 29 මගින් සමාලෝචිත වර්ෂයේ වියදම් ගිණුම් හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු අඩුවෙන් බිල් කිරීම ගැලපීම සඳහා හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත්, එසේ නොකර වෙනත් ආදායම් ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,562,282 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ රු.24,850 ක් වැඩියෙන් කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදනය කර තිබීම ගැලපීම සඳහා කර්මාන්ත ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත්, එසේ නොකර ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.24,850 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ පොදු ණයහිමියෝ රු.167,093 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබීම ගැලපීම සඳහා පොදු ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත්, එසේ නොකර වියදම් ගිණුම්වලට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.167,093 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ 'දොරින් දොරට ගමින් ගමට' වැඩසටහන යටතේ උඩපෙරෙට්ටුව මාර්ගය ඉදිකිරීමේදී රු.14,034 ක් වැඩියෙන් ණයගැති ප්‍රතිපාදනය කර තිබීම ගැලපීම සඳහා සමුච්චිත අරමුදල් ගිණුම හර කර කර්මාන්ත ණයගැති ගිණුම බැර කළ යුතු වුවත්, එසේ නොකර ප්‍රාග්ධන ආධාර ගිණුම හර කිරිම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ප්‍රාග්ධන ආධාර එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) 2008, 2012 හා 2014 වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ එකතුව රු.246,134 ක් වූ ප්‍රාග්ධන ආධාර කර්මාන්ත ණයගැති ගිණුමට බැර කළ යුතු වුවත්, එසේ නොකර ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කිරිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා කර්මාන්ත ණයගැති අවසාන ශේෂය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ප්‍රවර්තන වර්ෂයේ පසුගාමී හුදකලා ගම්මාන වැඩසටහන යටතේ බටවල මාර්ගය (යොවුන් ගම්මානයට යන පාර) ඉදිකිරීම වෙනුවෙන් රු.996,338 ක ණයැගති ප්‍රතිපාදනය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැති හා ප්‍රාග්ධන ආධාර එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ බිත්ති විදුලි පංකා 2 ක වටිනාකම වූ රු.17,400 ක් ප්‍රාග්ධනිත නොකිරීමෙන් එම වටිනාකමින් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) වරිපනම් බදු ඉදිරියට ලැබීම් රු.18,468 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.6,039 ක් වශයෙන් දැක්වීම හේතුවෙන්, ඉදිරියට ලැබීම් රු.12,429 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 <u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් අදාල කාර්යය නිම වූ වහාම පිය විය යුතු වුවත් 2012 හා 2015 වර්ෂවලට අදාල වූ රු.36,817 ක අත්තිකාරම් 2016 ජූනි 10 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදයමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.84,825 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,804,723 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.730,998 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

වයාපාර බදු

(අ) සමීක්ෂණය කරන ලද ව්‍යාපාර 22 කට අදාල සමීක්ෂණ වාර්තා තොරතුරු ව්‍යාපාර බදු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂය තුළ ව්‍යාපාර බදු හිමියන් 68 දෙනෙකු මුදල් ගෙවා තිබුණද ඉන් බදුකරුවන් 13 දෙනෙකුට අදාල සමීක්ෂණ වාර්තා තිබුණි. ඉතිරි බදුකරුවන් 55 දෙනෙකු සම්බන්ධව සමීක්ෂණ වාර්තා නොතිබුණි.

### 2.2.3 කර්මාන්ත බදු

(අ) සමීක්ෂණය කර හඳුනාගන්නා ලද බදුකරුවන් 8 දෙනාට අදාල සමීක්ෂණ වාර්තා තොරතුරු කර්මාන්ත බදු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) කර්මාන්ත බදු ලේඛනයේ සටහන් කර තිබූ මුදල් ගෙවූ බදුකරුවන් 38 දෙනෙකුගෙන් බදුකරුවන් 28 දෙනෙකු සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා නොතිබුණි.

### 2.2.4 වරිපනම් බදු

2015 දෙසැම්බර් 31 දින වන විට මදුරාවල ප්‍රධාන කාර්යාලයට අයත් වරිපනම් බදු  රු.473,303 ක්ද, වරකාගොඩ උප කාර්යාලයට අයත් රු.232,411 ක් හා රු.2,000 ට වැඩි දේපල 35 කින් රු.156,806 ක් අයවිය යුතු වුවද 2015 දෙසැම්බර් 31 දින දක්වා අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 දැන්වීම් පුවරු ගාස්තු

(අ) සභා බල ප්‍රදේශය තුළ සවි කර තිබූ දැන්වීම් පුවරු සඳහා 2015 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.186,585 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු 2015 ඔක්තෝබර් 15 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) අය විය යුතු දැන්වීම් පුවරු ගාස්තු නියමිත කාලය තුළ ගෙවීම සිදු නොකිරීම හේතුවෙන් එම ගාස්තු අයකරගැනීම සම්බන්ධයෙන් දැනුම් දීම් 2012 වර්ෂයෙන් පසුව සිදු කර නොතිබුණි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 10,023,814 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 4,323,495 |
| මුද්දර ගාස්තු | 5,700,319 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට ආපදා ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් වෙනුවෙන් සභාවට රු.241,403 ක් අයවීමට තිබුණි.

(ආ) 2014 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පුස්තකාලවලින් බැහැරට ලබා දී භාර නොදුන් පොත් 167 ක් පුස්තකාලවලට නැවත ගෙන්වා ගැනීමට 2015 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

3.2 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩිවන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.56,700 ක් වියදම් දරා තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) සේවක ණය පාලනය

(ඈ) අයවැය පාලනය